ශ්‍රී ලංකා වරාය අධිකාරිය

තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| **තනතුර, සේවා ගණය** | **සුදුසුකම්** | **වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය** | **සටහන** | **වයස් සීමාව** |
|---|---|---|---|---|
| 01. නාවික වැද්දුම්කරු<br>02. ඩීසල් වැද්දුම්කරු<br>03. පෑස්සුම්කරු<br>04. ඇලුමිනියම් ෆැබ්රිකේටර්<br>05. කම්මල්කරු<br>06. වාත්තුකරු<br>07. කුෂන්වැඩකරු<br>08. මොස්තරකරු<br><br>සේවා ගණය අර්ධ ශිල්පීය (SS) | දෙවරකට නොවැඩි වාර ගණනකදී , භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම<br><br>සහ<br><br>රජයේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන වෘත්තියට අදාළ සහතිකය හෝ වෘත්තියට අදාළ තෙවන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 3)<br><br>සමඟ<br><br>**පළපුරුද්ද**<br>රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අයදුම් කරනු ලබන තනතුරේ වසර තුන (03) ක පළපුරුද්ද | 10 : 3 (SS3)<br><br>මූලික වැටුප් පියවර : රු.35845/=<br><br>වාර්ෂික වේතනාධිකය : රු. 365/=<br><br>(දළ වැටුප මාසිකව රු. 111,000 /= ක් පමණ වේ) | සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය. | අවුරුදු 18 – 45 අතර විය යුතුය. (රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.) |

| තනතුර, සේවා ගණය | සුදුසුකම් | වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය | සටහන | වයස් සීමාව |
|---|---|---|---|---|
| 09. හම්වැඩකරු<br><br>සේවා ගණය අර්ධ ශිල්පීය (SS) | දෙවරකට නොවැඩි වාර ගණනකදී , භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම<br><br>සහ<br><br>රජයේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන වෘත්තියට හෝ වැද්දුම් ක්ෂේත්‍රයට අදාළ සහතිකය හෝ වෘත්තියට හෝ වැද්දුම් ක්ෂේත්‍රයට අදාළ තෙවන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 3)<br><br>සමඟ<br><br>**පළපුරුද්ද**<br>රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක හම්වැඩකරු වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද | 10 : 3 (SS3)<br><br>මූලික වැටුප් පියවර : රු.35845/=<br><br>වාර්ෂික වේතනාධිකය : රු. 365/=<br><br>(දළ වැටුප මාසිකව රු. 111,000 /= ක් පමණ වේ) | සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය. | අවුරුදු 18 – 45 අතර විය යුතුය. (රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.) |

**වෙනත්**

සෑම අයදුම්කරුවෙකුම,

i. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
ii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
iii. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.
iv. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.
v. රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තුමේන්තු / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තුමේන්තු / සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

**සැ.යු.**

2016.12.01 දිනැතිව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 28/2016 චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව ඉහත බඳවාගැනීම් පරිපාටිවල තාක්ෂණික හා කාර්මික අංශවල තනතුරු සඳහා බඳවාගැනීමේදී වෘත්තීය සුදුසුකම් ලෙස NVQ 3 හෝ NVQ 4 හෝ සමඟ අධ්‍යාපන සුදුසුකම් ලෙස අ.පො.ස. (සා.පෙළ) හෝ අ.පො.ස. (උ.පෙළ) හෝ ඇතුළත් කර ඇති අවස්ථාවකදී NVQ 3 හා NVQ 4 සුදුසුකම් ලබා තිබීම පිළිවෙලින් අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග සමත්වීම හා සමාන ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතික වල පිටපත් සමඟ ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම හා ලිපිනයන් සහිතව සකස් කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2026.07.23** දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වග කියනු නොලැබේ. අදාළ **අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන),**
**මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාශය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය,**
**කොළඹ,**